**තුනුක්කායි ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 13 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ඔක්තෝබර් 05 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට තුනුක්කායි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා විගණනයට ඉදිරිපත් කිරීමේදි අනුගමනය කළ යුතුව තිබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂය සඳහ වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට සුදුසු කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව පිළියෙල කිරිමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ආ) ප්‍රමාණාත්මක ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | කාර්යාල උපකරණ 19ක වටිනාකම එකතුව රු.63,665ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවි කිරීම් වටිනාකම රු. 63,665කින් වැඩියෙන් සහ කාර්යාල උපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු. 63,665.50ක කාර්යාල උපකරණ 2014, 2015 වර්ෂවල සිට වැරදීමකින් ලීබඩු හා සවිකිරීම් ගිණුමේ ඉදිරිපත් කර ඇත. මේ නිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | සභාවට ලබාදී තිබූ විවිධ වර්ගවල පරිගනක හා පරිගනක උපාංග එකතුව 25ක වටිනාකම පසුගිය වර්ෂ05 සිට වරශ 09ක් දක්වා කාලයක් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරිම නිසා මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම අතහැරී තිබුණි. | අනුමත තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරු මාර්ගයෙන් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරිමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල වර්ග 25ක පරිගනක හා පරිගනක උපාංගවල වටිනාකම තක්සේරු කමිටුව මගින් තක්සේරු කිරිමටත් මෙම වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල එහි වටිනාකම ඇතුළත් කිරිමට කටයුතු කරමින් පවති. |
| (iii) | පිරියත හා යන්ත්‍රෝපකරණ 03ක වටිනාකම එකතුව රු.521,000ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු.521,000කින් කාර්යාල උපකරණ වටිනාකම වැඩියෙන් දක්වා තිබූ අතර පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල සුදුසු අයුරින් දැක්වීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු.521,000ක් පිරියත හා යන්ත්‍රෝපකරණ 2013, 2016 සහ 2018 වර්ෂවල සිට කාර්යාල උපකරණ ගිණුමේ දක්වා ඇත. මේනිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |
| (iv) | යන්ත්‍රෝපකරණ 02ක වටිනාකම එකතුව රු.360,600ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු. 360,600කින් ලීබඩු හා සවිකිරීම් වටිනාකම වැඩියෙන් දක්වා තිබූ අතර පිරියත හා යන්ත්‍රෝපකරණ වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල සුදුසු අයුරින් දැක්වීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු.360,600.00ක් යන්ත්‍රෝපකරණ වැරදීමකින් ලීබඩු හා සවිකිරීම් ගිණුමේ දක්වා ඇත. මේ නිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |
| (v) | පරිගනක හා පරිගනක උපාංග 28ක වටිනාකම එකතුව රු.999,970ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු. 999,970කින් කාර්යාල උපකරණ වටිනාකම වැඩියෙන් සහ පරිගනක හා පරිගනක උපාංගවල වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු.1,275,020.00ක් (රු.999,970ක් ඇතුළුව) පරිගනක හා පරිගනක උපාංග වැරදීමකින් කාර්යාල උපකරණ ගිණුමේ දක්වා ඇත. මේ නිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |
| (vi) | ලීබඩු හා සවිකිරීම් 504ක වටිනාකම එකතුව රු.6,765,902ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල කාර්යාල උපකරණ වටිනාකම රු.6,765,902කින් වැඩියෙන් සහ ලීබඩු හා සවිකිරීම් වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල නිසි අයුරින් දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු. 6,765,902ක් වූ ලීබඩු හා සවිකිරීම් 2014, 2017 සහ 2018 වර්ෂවල සිට කාර්යාල උපකරණ ගිණුමේ දක්වා ඇත. මේ නිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (vii) | පරිගනක හා පරිගනක උපාංග 08ක වටිනාකම එකතුව රු.285,290ක් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ලීබඩු හා සවිකිරීම් ලෙස දැක්වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල රු. 285,290කින් ලීබඩු හා සවිකිරීම් වටිනාකම වැඩියෙන් සහ පරිගනක හා පරිගනක උපාංගවල වටිනාකම එම අගයෙන් අඩුවෙනුත් දක්වා තිබුණි. | ගැලපීම් සිදුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | එකතුව රු.285,290ක් පරිගනක හා පරිගනක උපාංග 8ක වටිනාකම 2017 සහ 2018 වර්ෂවල සිට වැරදීමකින් ලීබඩු හා සවිකිරීම් ගිණුමේ දක්වා ඇත. මේ නිසා මේ සඳහා අනුමැතිය ලබාගැනීමෙන් පසුව මෙම වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරනු ලැබේ. |
| (viii) | කාර්යාල සහ ලීබඩු හා උපකරණ 33ක වටිනාකම තක්සේරු කර පසුගිය වර්ෂ 05කදී මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල එහි වටිනාකම් අත්හැරී තිබුණි. | අනුමත තක්සේරුකරු හෝ රජයේ තක්සේරුකරු මාර්ගයෙන් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | අදාල වර්ග 33ක කාර්යාල සහ ලීබඩු හා උපකරණ වටිනාකම තක්සේරු කමිටුව මගින් තක්සේරු කිරීමටත් මෙම වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල එහි වටිනාකම ඇතුළත් කිරීමටත් කටයුතු කරමින් පවතී. |

**(ඇ) විගණනය සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වියදම් ණයහිමියෝ ගිණුම් 29ක සහ රජයේ බදු ණයගැතියන් දෙදෙනෙකුගේ ගිණුම් එකතුව රු. මිලියන 39.64කට ශේෂ සනාථ කිරීම් විගණනයට නොලැබීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස පිළිගෙන සනාථ කළ නොහැකි විය. | අනාවරණය කර ඇති ලිඛිත ලේඛන ලබාගෙන නියමිත පරිදි ගොනුගත කිරීමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුය. | පළාත් නිශ්චිත සංවර්ධන සහනාධාර සහ වියදම් ණයගැති ශේෂවල සනාථ කිරීම් සිදුකර ඇත. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 172(1) වගන්තිය | වැදගත් කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කළ යුතු වුවත්, 2019 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් ස්ථාපිත කර නොතිබුණි. | සභාව විසින් අතුරු ව්‍යවස්ථා ස්ථාපිත කිරීමට ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | II පරිච්ඡේදයේ 66 රීතිය | රු. 14,652,270ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා සභාව විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | හිඟ ආදායම් අයකරගැනීම සඳහා සභාවේ ලේකම්වරයා විසින් වහාම ක්‍රියාමාර්ග ගත යුතු වේ. | හිඟ මුදල් රු.397,010.00ක් අයකර ඇත. මෙහි බදුකුලී රු.86,681.26ක් අයකිරිම සම්බන්ධයෙන් නඩු පවරා ඇති අතර අදාල පුද්ගලයා මියයාම හේතුවෙන් හිඟ මුදල කපාහැරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. උසාවි දඩමුදල් මින් ඉදිරියේදි ලැබේ. |
| (ii) | III පරිච්ඡේදයේ 32 රීතිය | සභාව විසින් දේපළ බදු තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. | දේපළ බදු තක්සේරු කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ නොකිරීම නිසා දේපළ බදු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. |
| (iii) | III පරිච්ඡේදයේ 33 රීතිය | වරිපනම් බදු සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | වරිපනම් බදු ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ නොකිරීම නිසා වරිපනම් බදු පිළිබඳ ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණි. |
| (iv) | III පරිච්ඡේදයේ 59,60 රීති | ව්‍යාපාර බදු සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපාර බදු පිළිබඳ ප්‍රත්‍යාගණනයක් සිදුකර ඒවා අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. | අප සභා බල ප්‍රදේශය සංවර්ධිත ප්‍රදේශයක් ලෙස ප්‍රසිද්ධ නොකිරීම නිසා ව්‍යාපාර බදු පිළිබඳ තක්සේරු කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි. එනමුත්, වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකරනු ලැබේ. |
| (v) | IV පරිච්ඡේදයේ 108 රීතිය | තුනුක්කයිහි පිහිටි ළමා උද්‍යානය නඩත්තු කිරීමට පසුගිය දෙවර්ෂය තුළදි සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව වෙත පවරන ලද මෙම ළමා උද්‍යානය නිසි ලෙස නඩත්තු කර ළමයින්ට භාවිතා කිරීමට හැකි අයුරින් පුනරුත්ථාපනය කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. | යෝගපුරම් මධ්‍යම ළමා උද්‍යානයේ කාර්යයන් අරමුදල් ප්‍රමාණවත් නොවීම නිසා මේ දක්වා අවසන් කර නොමැත. ඉදිරි කාලයේදි සභාවේ අරමුදලින් හෝ/වෙනත් මූල්‍යාධාරවලින් හෝ මේ සඳහා ප්‍රතිපාදන සලසාගෙන කාර්යයන් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | අවසන් කර උද්‍යානය උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (vi) | V පරිච්ඡේදයේ 140 රීතිය | කොන්ත්‍රාත්කරුවන් පසුදෙනෙකුට සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබූ අත්තිකාරම් රු.3,297,000ක් නිරවුල් කර නොමැති බව නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් කාර්යයන් අවසන් නොවී තිබියදී කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් මුදල් ගෙවීමෙන් වැලැකී සිටිය යුතුවේ. | රු.3,197,000ක් ප්‍රවර්තන වර්ෂයේ අයකර ඇත. රු.40,000ක් කාර්යයන් අවසන් වූ විට නිරවුල් කරනු ලැබේ. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂයේ තැන්පත් ගිණුමේ දක්වා තිබූ ආපසු ගෙවිය යුතු විදුලි ගාස්තු තැන්පතු, ලංසු තැන්පතු, මාර්ග නඩත්තු තැන්පතු සහ අනෙකුත් තැන්පතු 04ක එකතුව රු.142,430ක් පසුගිය මාස 01 සිට මාස 15ක් දක්වා ආපසු නොගෙවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | කාලය ඉක්ම වූ තැන්පතු සම්බන්ධයෙන් පරිශීලනය කර නියමිත කාලයේ දී සභාව විසින් කටයුතු කළ යුතුය. | ආපසු ගෙවිය හැකි විදුලිය ගාස්තු සහ ලංසු තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 02ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | සභාවේ භාවිතයේ ඇති සියළුම කාර්යාල වාහන සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂාවක් නියමිත කාල වකවානුවේදි සිදු කිරීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. | සභාවේ වාහනවල ඉන්ධන පරිභෝජන පරීක්ෂාව 2019 ජූලි 02 දින සිදු කරන ලද නමුත් අදාල කාලපරිච්ඡේදයෙන් පසුව ලැබු වාහන දෙකක් සඳහා ඉනධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. එසේ වුවත්, මෙම වර්ෂයේ නියමිත කාලයේදි ඉහත පරික්ෂාවන් සිදුකරනු ලැබේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,883,071ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 10,337,630 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 170,000 | 384,900 | 384,900 | - | - | - | - | - |
| (ii) | කුලී | 16,234,320 | 5,196,522 | 4,603,784 | 679,419 | 4,485,450 | 2,656,630 | 2,609,480 | 151,131 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 933,300 | 632,300 | 632,300 | – | 1,054,000 | 796,000 | 796,000 | – |
| (iv) | වෙනත් ආදායම් | 10,375,592 | 16,489,393 | 5,199,527 | 13,972,850 | 6,847,500 | 11,895,397 | 4,776,856 | 10,038,205 |
| | එකතුව | **27,713,212** | **22,703,115** | **10,820,511** | **14,652,269** | **12,386,950** | **15,348,027** | **8,182,336** | **10,189,336** |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පැවැති හිඟහිටි ආදායම් එකතුව රු.14,652,270ක් විය. ඉන් 2019 ජනවාරි 01 දිනට පැවැති හිඟහිටි ආදායම් එකතුව රු.10,189,335ක් සමාලෝචිත වර්ෂය සඳහා සම්පූර්ණ ලැයිස්තුගත කළ ආදායම රු.22,703,115ක් සහ සමාලෝචිත වර්ෂයේ රැස්කළ මුළු ආදායම ආදිය සසඳා පරික්ෂා කර එහි සත්‍ය හා නිවැරදිභාවය සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවලත් ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබූ ආරම්භක හිඟහිටි ආදායම්, ලැයිස්තුගත කළ ආදායම්, රැස්කළ ආදායම් සමග සසඳා නිවැරදි කිරීමේදි අවසාන හිඟහිටි ආදායම් ලැබී නොතිබීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස පිළිගෙන තහවුරු කළ නොහැකි විය. | සමාලෝචිත වර්ෂය අවසානයේදි අයකර නොමැතිව පවතින හිඟහිටි ආදායම් සැසඳීමට හැකි අයුරින් ගිණුම් සැකසීය යුතු අතර මූල්‍ය ප්‍රකාශනවලද එම වටිනාකම ඉදිරියට ගෙන ඒමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

අයවැය ඇස්තමේන්තුව විධිමත්ව පිළියෙල නොකිරීමත්, ඇස්තමේන්තු කිරීම් නිවැරදිව සැලසුම් කර පුරෝකථනය නොකිරීමත් නිසා, ඇස්තමේනතුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර විචලනයන් ඇති වී තිබුණි.

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් කඩ කුලී, ත්‍රිරෝදරථ කුලී, බදු ගාස්තු, අපද්‍රව්‍ය බැහැරකිරීමෙ ගාස්තු, මෝටර් ග්‍රේඩර් කුලි ආදිය නියමිත පරිදි අයකර ගැනීමේ මන්දගාමී ස්වරූපයක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂයේ රැස්කර තිබූ ආදායම් එකතුව රු.මිලියන 12.566 ක් සමාලෝචිත වර්ෂයට අදාළ එවැනි ආදායම් රු.මිලියන 17.03 කින් සියයට 73.78 ක් සහ පසුගිය වර්ෂවල අයකර ගත යුතුව තිබූ එකතුව රු.මිලියන 27.22 කින් සියයට 46.16කුත් වී තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂ අවසානයේ පැවති හිඟ ආදායම්වල කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ආදායම් නියමිත කාලයේදි අයකර ගැනීමටත්, හිඟ ආදායම් වැලැක්වීමටත් සභාවේ ලේකම්වරයා විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 2.2.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහ පසුගිය වර්ෂවලත් කඩකුලී, මෝටර් ග්‍රේඩර් කුලි, මාසික අපද්‍රව්‍ය බැහැරකිරිමෙ ගාස්තු, ත්‍රිරෝදරථ කුලි, හිඟහිටි බදු ගාස්තුවල එකතුව රු.814,319ක් අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වර්ෂ 07 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු ආදායම් නියමිත පරිදි අදාල කාලවකවානු තුළ විධිමත්ව අයකර ගැනීම සඳහා සභාවේ ලේකකම් වරයා විසින් අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. | රු.330,628 මෙම වර්ෂයේ අයකර ඇත. ඉතිරි මුදල් අයකිරිමට කටයුතු කරනු ලැබේ. |

### 2.2.4 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට රු.13,836,466ක උසාවි දඩ මුදල් සහ රු. 1,485ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි. | උතුරු පළාත් ප්‍රධාන ලේකම්වරයාගෙන් නියමිත කාලයේදි ලබාගැනීම සඳහා සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතු වේ. | උසාවි දඩ මුදල් මින් ඉදිරියේදි ලැබෙනු ඇත. එමෙන්ම මුද්දර ගාස්තු රු. 1,485.00ක් අයකර ගැනීම සඳහා කටයුතු කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් සහ ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳ නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ සියළුම වර්ගයේ ක්‍රියාකාකරකම් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත් ආකාරයෙන් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඒ සඳහා වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතු වේ. | ඒවන විටත් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ බැහැර කරනු ලබන කැලිකසළ, ගිනිතැබීම හා වළදැමීම යන කාර්යයන් පමණක් සභාව විසින් සිදු කරන අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘති වැනි ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට සභාව විසින් පසුගිය වර්ෂ 05කදි ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතිවලින් සමන්විත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරිමට සභාව විසින් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | තුනුක්කායි ප්‍රා දේශීය සභා බල ප්‍රදේශයට අයත් ප්‍ර දේශවල දිනකට ආසන්න වශයෙන් ටොන් 0.6ක කසල රැස්කරනු ලැබේ. මෙම කසල දිරන, තහඩු, බෝතල් කටු සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය ලෙස වෙන්කරමින් පවති. තවද, අප වෙත ලැබෙන කසල ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමාපායයන් මගින් භාවිතා කිරීමට ප්‍රමාණවත් නොවන නිසාත් ඒ සඳහා වන යන්ත්‍ර වියදම් අධික බැවිනුත් ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලිය සිදු කර නොතිබුණි. |

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2030 වර්ෂයේ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සභාව විසින් ඉටුකර ගතයුතු ඉලක්ක සහ එම ඉලක්ක | තිරසාර සංවර්ධන ඉලක්ක ස්ථාපිත කර එහි වාර්ෂික ප්‍රගතිය දැනගැනීම සඳහා දර්ශක | ඉදිරි කාලයේදි යෝජිත සැලැසුම් සහ සංවර්ධන ක්‍රියාකාරකම් සියල්ල දීර්ඝකාලීන සංවර්ධනය අරමුණු කරගෙනම සිදු කරනු |

| | | |
|---|---|---|
| ළඟාකර ගැනීමේදි පවතින බාධක මෙන්ම ඉදිරි ක්රියාකාරකම් මැනීම සඳහා දර්ශකයන්ද 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ප්‍රකාරව පසුගිය දෙවර්ෂයේදි ස්ථාපිත කිරිමට සභාව විසින් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | ස්ථාපිත කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතු වේ. | ලැබේ. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව අයවැය ප්‍රකාරව ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක නොකර එකතුව රු.මිලියන 33.186ක පසුගිය වර්ෂ 01 ක සිට වර්ෂ 11ක් දක්වා බැංකුවක ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. | මහජනතාවට ප්‍රතිලාභයක් අත්වන ව්‍යාපෘතිවල එවා ආයෝජනය කිරිමටත්, මහජන සුභසාධනය සිදුකළ හැකි අයුරිනුත් එම අරමුදල් උපයෝගී කරගෙන ආදායම් ඉපැයීම වැඩිකිරිමටත් සභාව විසින් උචිත ක්‍රියාමාර්ග ගතයුතු වේ. | අප සභාවේ ස්ථාවර තැන්පතු ලෙසම 2016 වර්ෂයෙන් පසුව තැන්පත් කර නොතිබූ අතර ඉහත තැන්පතු ආපසු ලබාගෙන සභාවේ සංවර්ධන සහ ආදායම් ඉපැයීමේ කාර්යයන්වල යෙදවීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු.මිලියන 4.9කට ඇස්තමේන්තු කර තිබූ මූලධන වැඩසටහන් 12ක් ක්‍රියාත්මක නොකර මුළුමනින්ම අතහැර දමා තිබුණි. කෙසේවෙතත්, මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් වී නොතිබුණි. | අනුමත කළ ආකාරයෙන් සභාවේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ඇතුළත් කළ විෂයයන් ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් පියවර ගත යුතු වේ. | සභාවේ තීරණ ප්‍රකාරව ඒ වෙනුවට වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කර ඇත. කාර්යයන් දෙකක් තීරණ අංක:326/2019 අනුව අත්තිකාරම් ලබාදී ඇත. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

**තනතුරු පුරප්පාඩු සහ අතිරික්තයන්**

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අදාළව අනුමත කළ සේවක සංඛ්‍යාවෙන් පුස්තකාලයාධිපති, වෙළඳපොළ සුපරීක්ෂක මේ දක්වා පත්කර නොතිබීමෙන් පුස්තකාල ක්‍රියාකාරකම් සහ වෙළඳපොළ | එවැනි කාර්යමණ්ඩලය නියමිත පරිදි පත්කර සභාවේ කාර්යයන් විධිමත්ව ක්‍රියාත්මක කිරිමට සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගතයුතු වේ. | වාර්ෂික ස්ථානමාරුවලින් පසුව දැනට කළමනාකරණ සේවා නිලධාරි අනුමත කළ කාර්ය මණ්ඩලය පමණක් සිටී. වෙළෙඳපොල සුපරීක්ෂක පුරප්පාඩු අප අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ |

| | | |
|---|---|---|
| ක්‍රියාකාරකම් සුපරීක්ෂණයෙහි මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය. | | සුදුසුකම් සහිත පුද්ගලයන් නොමැති වීමෙන් පිටතින් පත්කිරීමට අනුමැතිය ඉල්ලා උතුරුපළාත් පළාත් පාලන කොමසාරිස්වරයාට ලිපි යවා ඇත. නැවත මාගේ අංක Np/14/44(05)/01/08/2019 දරන 2019 ජූලි 29 දිනැති ලිපිය මගින් වෙළෙඳපොල සුපරික්ෂක පුරප්පාඩුව පිටතින් බඳවා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර නැවත ප්‍රා දේශීය පළාත්පාලන සහකාර කොමසාරිස්වරයා මාර්ගයෙන් යවා ඇත. එසේම, අපගේ මහජන පුස්තකාලය වෙනුවෙන් පුස්තකාලයාධිපති පත්නොකිරීමෙන් කාර්යක්ෂම ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන යා නොහැකි තත්ත්වයක් පවතින බව අනාවරණය කර පුරප්පාඩු පිරිවීමට අදාල බලධාරීන්ට මාගේ අංක Np/14/44(05)/01/11/2018 දරන 2018 ජූලි 23 දිනැති සහ 2018 සැප්තැම්බර් 12 දිනැති ලිපිය මගින් යවා ඇත. |
| (ii) සභාවට අනුමත කළ කාර්ය මණ්ඩලයට අතිරික්තව කළමනාකරණ සේවා නිලධාරියෙකු රාජකාරිය සඳහා යොදවා තිබුණු බව නිරීක්ෂණය විය. | අතිරික්ත කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් උතුරු පළාත්, පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර කළමනාකරණ සේවා නිලධාරි කාර්ය මණ්ඩලය විහිදීයන පරිදි කටයුතු කල යුතුවේ. | |

## 3.4 මතභේදාත්මක ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ විවිධ වූ පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කාර්යයන් සඳහා කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට සහ ප්‍රජාමූල සංවිධාන තුනකට සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 3.30ක් සභාවේ අරමුදලින් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ නමුත් ඒවා මේ දක්වා නිරවුල් නොකළ අවස්ථා 05ක් විගණනයේදි නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත් කාර්යයන් අවසන් නොවී පවතින විටෙක කොන්ත්‍රාත්කරුවන්ට අත්තිකාරම් ගෙවීමෙන් වැලැකී සිටිය යුතුවේ. | රු.3,197,000 මෙම වර්ෂයේ අයකර ඇත. රු.40,000ක් කාර්යය අවසන් වූ වහාම නිරවුල් කෙරේ. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| | විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විවිධ වූ රජයේ සහ පුද්ගලික සංවිධානවලින් සභාවට පරිත්‍යාග කළ වතුර ටැංකිය, ට්‍රැක්ටර් වැනි වාහන 05ක් සභාවට අයත් ලෙස පවරා ගැනීමට මේ දක්වා ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | සභාවට නොපවරාගත් සභාව විසින් භාවිත කරනු ලබන වාහන සභාවට අයත් ලෙස මාරුකිරීමට ඵලදාය ක්‍රියාමාර්ග සභාව විසින් නියමිත කාලයේදි ගත යුතු වේ. | අයිතිය පැවරීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ඉඩම්, ගොඩනැගිලිවල වටිනාකම එකතුව රු. මිලියන 79.48ක් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මේවා සභාවට අයත් බවට හිමිකම් ඔප්පු, මිනින්දෝරු ප්ලෑන, ලිපිගොනු ආදිය සභවේ නොමැති විය. | සභාවට අයත් බවට හිමිකම් ඔප්පු ලබාගැනීමටත්, දේපළ තක්සේරු කර එහි සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමටත් සභාව විසින් ඵලදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. | (අ) අදාල ඉඩම් සඳහා මිනින්දෝරු සැලැසුම් ඇත. තවද, ඉඩම් ලියාපදිංචි බලපත්‍ර ලබිගැනීමට ඉඩම් කොමසාරිස්වරයා මාර්ගයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉඩම් තක්සේරු කිරිම සඳහා තක්සේරු පාර්තමේන්තුවටත් ඉල්ලීම් ඉදිරිපත් කර ඇත.<br>(ආ) ගොඩනැගිලි 25ක් සඳහා වටිනාකම තක්සේරු සහතික සහ කර්‍මාන්ත ලිපිගොනු සභාව සතුව පවතී. |

**3.5.2 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට පරිත්‍යාග කර තිබූ වතුර මෝටරය, අතට්‍රැක්ටරය පසුගිය වර්ෂ 10කදි අලුත්වැඩියා කර භාවිතයට සුදුසු ආකාරයට පත් කිරිමට ඵලදායි ක්‍රියාමාර්ග සභාව විසින් ගෙන නොතිබුණි. | මේවා අලුත්වැඩියා කර නියමිත පරිදි භාවිතය සඳහා යෙදීමට සභාව විසින් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

**3.5.3 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සෙවිලි තහඩු 10 ක් වර්ෂයකට අධික කාලයක සිට භාවිතා නොකර ගබඩාවේ පැවති බව | මෙම සෙවිලි තහඩුවල වටිනාකම හෙළිදරව් කර ඒවා ගබඩාවේ රඳවා | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

| | |
|---|---|
| නිරීක්ෂණය වූ අතර එහි වටිනාකමද විගණනයට ලැබී නොතිබුණි. | තැබීමට හේතු සොයා බලා නියමිත පරිදි භාවිතා කිරිමට සුදුසු ක්‍රියාමාර්ග ගතු යුතුවේ. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අයවැය සැලැස්ම නිවැරදි පුරෝකතනයන් අනුව සැලසුම් කර පිළියෙල නොකිරීම නිසා වර්ග 05ක ඇස්තමේන්තුගත වියදම් හා තථ්‍ය වියදම් අතර යහපත් විචලනයන් පිළිවෙලින් සියයට 09 ක සියයට 68 ක් දක්වා පරාසයක ද, වර්ග 06ක ඇස්තමේන්තුගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර අයහපත් විචලනයන් සහ යහපත් විචලනයන් පිළිවෙලින් සියයට 32 සිට සියයට 126 දක්වා ද ඇති වී තිබුණි. | සභාව විසින් උචිත මූලික කරුණු සැලැකිල්ලට ගෙන ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි වාර්ෂික අයවැය සැලැස්මක් සකස් කර මහජනතාවගේ එකඟතාවයට ඉදිරිපත් කර ඒවා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරිමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතු වේ. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. |

### 4.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කටයුතු පරීක්ෂා කර කාර්යක්ෂමව එහි ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන වාර්තා පසුගිය දෙවර්ෂය තුළදී විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා සකස් කිරිමට කටයුතු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සාර්ථක අන්දමින් කරගෙන යනු ලබන අතර පරීක්ෂණ වාර්තා අභ්‍යන්තර විගණන පරීක්ෂණ ලිපිගොනුවේ ගොනුගත කර ඇති අතර දෝෂයකින් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |